කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2012/13

2015 දෙසැම්බර් - 2016 පෙබරවාරි

# ජනසන්නිවේදනය - MACO E 1015

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

ප්‍රශ්න සංඛ්‍යාව 08 යි. කාලය පැය : 03 යි.

---

1. ''සමාජ අන්තර් සම්බන්ධතා සන්නිවේදනය මත සිදු වේ'' විල්බර් ශ්‍රාම්, චාල්ස් කූලි, එඩ්වඩ් සැපීර්, විලියම් ආර්. රිවර් යන විද්‍යාඥයින්ගේ නිර්වචන ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 20)

2. ''සන්නිවේදකයාට සන්නිවේදන මූලිකාංග පිළිබඳ න්‍යායික සහ ප්‍රායෝගික අවබෝධය වැදගත් වේ'' පැහැදිලි කරන්න.

(ලකුණු 20)

3. i. සමූහ සන්නිවේදනයේ ප්‍රබලත්වය විවිධ ක්ෂේත්‍රවලට විශේෂිතව සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

ii. පුද්ගලාන්තර සන්නිවේදනය හා ජනසන්නිවේදනය අතර වෙනස මූලික සාධක පහක් (05) ඇසුරෙන් විස්තර කරන්න.

(ලකුණු 10)

4. ''සෝවියට් කොමියුනිස්ට් සන්නිවේදන සංකල්පය අධිපතිවාදී සන්නිවේදන සංකල්පයේම දිගුවීමකි'' සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

5. ''බෲස් වෙස්ට්ලි හා මැල්කම් මැක්ලීන් ආකෘතිය ජනමාධ්‍යවල තොරතුරු තෝරා ගන්නා ආකාරය හඳුනා ගැනීමට උපකාරී වේ'' පහදන්න.

(ලකුණු 20)

6. ''මාධ්‍ය ප්‍රතිපත්තිවල පදනම යහපත් මාධ්‍ය සමාජයක් ගොඩනැංවීමයි'' ලංකාවේ ක්‍රියාත්මක මාධ්‍ය පනත් සහ ආචාරධර්ම සංග්‍රහවලට විශේෂිතව සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

7. i. මාධ්‍ය සංස්කෘතියේ ලක්ෂණ පහක් (05) නම් කර ඉන් එකක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

(ලකුණු 10)

ii. මාධ්‍ය සාක්ෂරතාව යනු කුමක් ද? කෙටියෙන් පහදන්න.

(ලකුණු 10)

8. පහත සඳහන් මාතෘකා අතරින් ඕනෑම **<u>හතරක් (04)</u>** පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. විනෝදාස්වාද සම්පාදනය
ii. ජනමතය
iii. සන්නිවේදන පර්යේෂණ
iv. නිර්වාචික සන්නිවේදනය
v. දොරටුපාල සංකල්පය
vi. ගෝලීයකරණය

(ලකුණු 5x 4 = 20)

******************************